# ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ සුභ පැතුම් පණිවිඩය



සමෘද්ධිමත් කෘෂි ආර්ථිකයක් බිහිකරලීමේ නිරන්තර උත්සාහයක නිරත වන කෘෂිකර්ම අමාත්‍යාංශය ඒ සඳහා ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන ආරම්භ කළේය. එහිදී තුන් අවුරුදු ආහාර නිෂ්පාදන සැලසුම් අනුව රටේ ආහාර නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශයේ අවධානය යොමුව ඇත. දිවයිනේ සෑම ප්‍රදේශයක්ම, දිස්ත්‍රික්කයක්ම සහ පළාතක්ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක වන ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන වෙනුවෙන් ප්‍රමුඛ දායකත්වය ලබාදීමට හැකිවීම වත්මන් කෘෂිකර්ම අමාත්‍යවරයා ලෙස මා ලද අනගි අවස්ථාවකි. මෙම ක්‍රියාවලිය අඛණ්ඩව සහ සාර්ථකව ක්‍රියාත්මක වෙතැයි මා තුළ දැඩි විශ්වාසයක් පවතින අතර ඒ සඳහා හදවතින්ම සුබ පැතුම් එක්කරමි.

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යනු එක් පාර්ශවයකට පමණක් සිදු කළ හැකි දෙයක් නොවේ. සියලුම පළාත් මෙම වැඩසටහන සඳහා උපරිම දායකත්වය සැපයිය යුතුය. සෑම පාර්ශවයක් විසින්ම කළ යුතු කාර්යයන් නිසියාකාරව ඉටු කිරීම තුළ පමණක් මෙහි සාර්ථකත්වය රැඳී පවතියි.

මෙම තුන් අවුරුදු සැලැස්ම අනුව වඩාත් ක්‍රමානුකූලව වගා කටයුතු සිදු කළ යුතුය. ඒ ඒ පළාත්වල පවතින පාරිසරික සාධක මත පිහිටා පසට ගැලපෙන බෝගය හඳුනාගෙන වගා සැලැස්ම ක්‍රියාත්මක කිරීම වැදගත්ය. මෙම සාමුහික ක්‍රියාවලියේ දී ජාතික ඉලක්ක ජය ගැනීමට නම් පළාත් අතර නිවැරදි සන්නිවේදනයක් තුළින් අන්‍යයෝන්‍ය අවබෝධය වර්ධනය කර ගත යුතුය.

රටේ ජනතාවගේ පරිභෝජනය සඳහා අවශ්‍ය ආහාර රට තුළම නිෂ්පාදනය කරමින්, කෘෂි ආර්ථිකය සවිබල ගන්වන ගොවි ප්‍රජාවගේ අතමිට සරු කරමින් කෘෂිකර්ම අංශය දියුණු කිරීමට ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන ඉවහල් වනු ඇත. ඒ සඳහා දිවයිනේ සෑම පළාතක්ම ස්වකීය වගකීම නොපිරිහෙලා ඉටු කරනු ඇතැයි මම අපේක්ෂා කරමි. සීමා මායිම් පසෙකලා එකම අරමුණක් වෙනුවෙන් අප සැම එක්වන්නේ නම්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ අපේක්ෂාව සඵල වනු නිසැකය.

දුමින්ද දිසානායක (පා.ම)
කෘෂිකර්ම අමාත්‍ය

# කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



දූපත් රාජ්‍යයක් වන අප විශිෂ්ඨ ගණයේලා සම්පත්වලට හිමිකම් කියන අතර ඉන් එක් සම්පතක් ලෙස කෘෂිකර්මාන්තය හැඳින්විය හැක. ග්‍රාමීය ජනතාවගෙන් 65% ක් පමණ කෘෂි ආර්ථිකයකට අයිතිවාසිකම් කියන අතර ඔවුන්ගේ දිවි පැවැත්ම කෘෂිකර්මාන්තය සමඟ බැඳී පවතී. තවද කාර්මික විප්ලවයත් සමඟ ලෝකයේ බොහෝ රටවල් නොයෙකුත් යාන්ත්‍රික කර්මාන්තවලට යොමු වීමත් සමඟ කෘෂිකර්මාන්තයට වූ අවධානය අඩු විණි. එහි ප්‍රතිඵලයක් ලෙස ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් විවිධ කතිකා ගෝලීය වශයෙන් ඇති කිරීමටත් විවිධ සම්මුතීන් ගෝලීය වශයෙන් ගෙන ඒමටත් සිදු විණි. අප ඉදිරියේ එලෙස පවතින ආහාර සුරක්ෂිතතාව පිළිබඳ අවධානම අවම මට්ටමක පවත්වා ගෙන යාම සඳහා ගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව ගරු අග්‍රාමාත්‍යතුමාගේ උපදෙස් පරිදි ගරු කෘෂිකර්ම අමාත්‍ය දුමින්ද දිසානායක ඇමතිතුමාගේත්, ජනාධිපති කාර්යාලය සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ මැදිහත් වීම මත ජාතික ආහාර නිෂ්පාදන තුන් අවුරුදු සැලැස්ම එළි දක්වන ලදී. මෙහි මුඛ්‍ය පරමාර්ථය වූයේ අප මිහිතලය තුල ස්වයංපෝෂිත ලෙස නිෂ්පාදනය කළ හැකි ආහාර බෝග වගා කිරීම සඳහා අවශ්‍ය විද්‍යාත්මක දැනුම, යටිතල පහසුකම්, බීජ, පොහොර වැනි අංග ලබා දෙමින් ගොවි ජනතාව සමඟ කෘෂිකර්ම අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන එක් කර ගනිමින් 2018 වන විට මිරිස්, බී ලූණු, අල, මුං ඇට වැනි තෝරා ගත් මූලික බෝග ලැයිස්තුවකින් රට ස්වයංපෝෂිත කරවීමය. මෙම කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ධෛර්යය සහ ශක්තිය සමස්ථ ගොවි ජනතාවටත් සියලුම නිලධාරීන්ටත් ලැබේවායි පතමි.

වසන්ත අලුවිහාරේ (පා.ම)
කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය

# බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ පණිවිඩය



අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ගේ සංකල්පයක් අනුව 2016-2018 වර්ෂයන් සඳහා ක්‍රියාත්මක කරන ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන බස්නාහිර පළාතේ ක්‍රියාත්මක කිරීම මගින් මෙම පළාතේ ජනතාවට සුවිශේෂී වාසි රැසක් අත්වනු ඇත. විශේෂයෙන්ම බහුතරයක් ජනතාව ආහාර අවශ්‍යතාවයන් වෙළඳපොළ තුළින්ම ඉටු කරගන්නා පළාතක ඔවුන්ගේ දෛනික අවශ්‍යතාවයන්ගෙන් කොටසක් හෝ පළාත තුළ නිෂ්පාදිත ආහාර ද්‍රව්‍ය මඟින් සපුරා ගැනීමට උනන්දු කරවීමට සහ ඉඩ සැලැස්වීමට මෙමගින් අවකාශ සැලසෙනු ඇත.

එමෙන්ම ධාන්‍ය, පළතුරු, එළවළු ආදී ආහාර බෝග මෙන්ම කිරි, මස්, බිත්තර වැනි නිෂ්පාදනයන්ද පළාත තුළ වැඩිවීමත් ඒ ආශ්‍රිත ස්වයං රැකියාවල නියුතු වූවන්ගේ ආදයම් තත්වය ඉහළයාමත් එමගින් සිදුවනු ඇත.

මෙම ජාතික ආහාර නිෂ්පාදන වැඩපිළිවෙල මඟින් පළාතේ දළ දේශීය නිෂ්පාදිතය, රටේ සමස්ථ දළ දේශීය න්ෂ්පාදිතය මෙන්ම ඒක පුද්ගල ආදායම වැඩිවීමත් නිරායාසයෙන්ම සිදුවේ. තවද වාරි පද්ධති වැඩිදියුණු වීම තුළින් ඉඩම් ඵලදායීතාව වැඩිවීමත් පරිසර පද්ධතිය දියුණු වීමත් සැලකිල්ලට ගතයුතු කරුණුය.

වැඩිවන ජනතාවට සාපේක්ෂව ආහාර සුරක්ෂිතතාවය සහ ගුණාත්මක පරිභෝජන රටාව වැඩි දියුණු වීම සහ යටිතල පහසුකම් වැඩි දියුණු වීම මෙන්ම පළාතේ ජනතාවගේ ආදායම් තත්වයද වැඩි දියුණු වීම සැලසෙන්නා වූ අතිගරු ජනාධිපතිතුමාගේ මෙම සංකල්පය සාර්ථක කර ගැනීමට ඉඩ සැලසීමට බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් මාගේ නිරන්තර දායකත්වය දක්වන බව ඉමහත් සතුටින් ප්‍රකාශ කරමි.

ඉසුරු දේවප්‍රිය

ප්‍රධාන අමාත්‍ය

බස්නාහිර පළාත

# බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යතුමාගේ පණිවිඩය



ආහාර සුරක්ෂිතතාව සාක්ෂාත් කර ගැනීම, ගොවි ප්‍රජාවට ඉහළ මට්ටමේ තිරසාර ආදායම් ප්‍රභවයන් වර්ධනය කරදීම, පරිසර සංරක්ෂණය මෙන් ම ස්වාභාවික සම්පත් තිරසාර ව කළමනාකරණය කිරීම, අන්තර් ජාතික වෙළඳපොළ ජයගැනීම වැනි බහුවිධ ඉලක්ක සපුරා ගැනීම අපේක්ෂා කරමින් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක කිරීමට යෝජිත දේශීය ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන සඳහා බස්නාහිර පළාත් කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය මගින් 2016-2018 වර්ෂයන් සඳහා විශේෂ තුන් අවුරුදු සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ආහාර අවශ්‍යතාවයෙන් ඵලදායී ප්‍රතිශතයක් පළාත තුළ ම නිෂ්පාදනය කර ගැනීම අරමුණු කරගනිමින් කෘෂිකර්ම, වාරිමාර්ග සහ සත්ව නිෂ්පාදන ක්ෂේත්‍රයන්හි ඒකාබද්ධ සැලැස්මක් තුළින් ජාතික ආහාර වැඩසටහන සඳහා සක්‍රීය දායකත්වයක් සැපයීමට මෙම අමාත්‍යාංශය කටයුතු කරනු ලබන බව ඉතා සතුටින් දැනුම් දීමට කැමැත්තෙමි. මෙම වැඩසටහන සඳහා අප අමාත්‍යාංශය යටතේ පවතින කෘෂිකර්ම, වාරිමාර්ග හා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය යන දෙපාර්තමේන්තු කැපවීමෙන් ක්‍රියා කරනු ලබයි. මෙහිදී කෘෂිකර්ම විෂය යටතේ වී වගාව, පළතුරු වගාව, එළවළු වගාව සිදු කිරීමට නියමිත අතර වී වගාව යටතේ පුරන් කුඹුරු අස්වැද්දීමටත් කෙසෙල්, අන්නාසි, රඹුටන්, දූරියන්, වැල් දොඩම්, ජමනාරං, කටු අනෝදා වැනි පළතුරු ප්‍රචලිත කිරීමටත් බණ්ඩක්කා, වම්බටු, මෑ වර්ග, පතෝල, කරවිල, වැටකොළු, පිපිඤ්ඤා, මාළු මිරිස්, රාබු, බුෂිටා, අමු මිරිස්, කොළ එළවළු ප්‍රචලිත කිරීමටත් කටයුතු කරනු ලබන අතර එමගින් පළාත් ජනතාවගේ දෛනික පරිභෝජනය සඳහා යොදා ගන්නා එළවළු පළතුරු අවශ්‍යතාවය ඉටුකර ගැනීම අපගේ ප්‍රයත්නයයි. වාරිමාර්ග විෂය යටතේ බස්නාහිර පළාතේ පුරන් ව ඇති කෘෂි ඉඩම් විධිමත් ජල කළමනාකරණය තුළින් නැවත වගා කළ හැකි සරුසාර ඉඩම් බවට පත් කිරීම සහ නිරතුරුවම පළාතේ වාරි පද්ධති ක්‍රමානුකූලව සකස් කිරීම සිදුකරනු ලබයි.

මේ වන විටත් බස්නාහිර පළාතේ මස්, කිරි හා බිත්තර යන නිෂ්පාදනය පළාතේ අවශ්‍යතාවය සපුරාගැනීමට ප්‍රමාණවත් වන අතර තවදුරටත් වඩා ගුණාත්මක සත්ව ආහාර නිෂ්පාදන ජනතාවට ලබාදීමේ අරමුණින් නවීන තාක්ෂණ ක්‍රම භාවිත කරගනිමින් සත්ව ආහාර නිෂ්පාදනය වැඩි කිරීම සඳහා සත්ව ගොවිපලවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා සත්ව, සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් පැවැත්වීම සත්ව නිෂ්පාදන විෂය යටතේ සිදු කරනු ලබයි. වැඩිවන ජනගහනයට සාපේක්ෂව ආහාර සුලභ කිරීමටත්, ආහාර සුරක්ෂිතතාව ඇති කිරීමටත් දේශීය ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන මගින් හැකි වනු ඇත. මෙම මහඟු ජාතික කර්තව්‍ය සඳහා පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය ලෙස සැලකියයුතු දායකත්වයක් ලබාදීමට හැකිවීම පිළිබඳව මා බෙහෙවින් සතුටට පත්වන අතර, අතිගරු ජනාධිපතිතුමාගේ මෙම උදාර සංකල්පය ඉදිරියටත් සාර්ථක කර ගැනීමට නිරතුරුවම සහයෝගය දක්වන බවද සඳහන් කරමි.

ගාමිණී තිලකසිරි (කෘෂිකර්ම අමාත්‍ය, බස්නාහිර පළාත)

1st FOOD FIRST

**කෘෂිකර්මය කලාවකි. එය සූත්‍රයක් නොවේ.**

**– විධායක අධ්‍යක්ෂ ලොරන් කාඩෙලි (ඒ.ජී.සී. සමාගම)**

# පටුන


01. හැඳින්වීම ---------- 1-2

02. පළාත් සිතියම ---------- 3

03. පළාත් ඉලක්ක සාරාංශය ---------- 4

04. කොළඹ දිස්ත්‍රික්ක ඉලක්කය ---------- 5-21

05. ගම්පහ දිස්ත්‍රික්ක ඉලක්කය ---------- 22-41

06. කළුතර දිස්ත්‍රික්ක ඉලක්කය ---------- 42-60